රේගු මන්දිරය, අංක 40, කෙලින් වීදිය, කොළඹ 11.
சுங்க இல்லம், இல. 40, பிரதான வீதி, கொழும்பு 11.
Customs House, No. 40, Main Street, Colombo 11.

වෙබ් අඩවිය / வெப் தளம் / Web Site: www.customs.gov.lk

# ශ්‍රී ලංකා රේගුව
# இலங்கைச் சுங்கம்
# Sri Lanka Customs

මගේ අංකය / எனது இல. / My No.: Log/S/09/13/IDP

ඔබේ අංකය / உமது இல. / Your No.: ..................

දිනය / திகதி / Date: 2025.11. 11

E-WIS PERIPHERALS (PVT) LTD.
13 NOV 2025
RECEIVED

කළමනාකරු,
E-wis Peripherals (Pvt) Ltd, No 142, Galle Road,
Colombo 03

මහත්මයාණෙනි,

**<u>Zebra ZC 300 වර්ගයේ ID Card Printer යන්ත්‍රය අලුත්වැඩියා කිරීම සඳහා මිල ගණන් කැඳවීම.</u>**

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ 6 වන මහල, සේවා සැපයීම් අංශයේ රාජකාරි කටයුතු සිදුකරනු ලබන Zebra ZC 300 වර්ගයේ ID Card Printer යන්ත්‍රය අලුත්වැඩියා කර ගැනීම සඳහා ඔබ ආයතනයෙන් මිල ගණන් කැඳවනු ලැබේ.

02. රේගු දෙපාර්තමේන්තුවේ 6 වන මහල, සේවා සැපයීම් අංශයේ ඇති එම ID Card Printer යන්ත්‍රය 2025.11.14 දින සිට 2025.11.25 දින පෙ.ව. 9.30 සිට ප.ව. 3.00 දක්වා පැමිණ පරීක්ෂා කර බැලිය හැකිය.

03.ඒ අනුව, ඔබ විසින් මිල ගණන් බහාලනු ලබන කවරයේ වම් පස ඉහල කෙළවරේ "ID Card Printer අලුත්වැඩියා කිරීම සඳහා මිල ගණන්" යනුවෙන් සඳහන් කර රේගු අධ්‍යක්ෂ (සේවා සැපයීම්), ශ්‍රී ලංකා රේගුව, අංක 40, කෙලින් වීදිය, කොළඹ 11 යන ලිපිනයට 2025.11.26 වන දින ප.ව. 2.00 ට පෙර, ලියාපදිංචි තැපෑලෙන් යොමු කිරීම හෝ අතින් ගෙනවිත් ලංසු බහාලන පෙට්ටියේ බහාලීම සිදු කළ යුතුය.

04. ඔබගේ මිල ගණන් රජයේ බදු රහිතව පෙන්නුම් කළ යුතු අතර, රජයේ බදු අය කරන්නේ නම් එම බදු වෙනම සඳහන් කළ යුතුය.

05.ලංසු භාර ගැනීම 2025.11.26 වන දින ප.ව. 2.00 ට අවසන් වන අතර, එදින ප.ව. 2.00 ට පසු ලැබෙන මිල ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. භාර ගැනීම අවසන් වූ වහාම එදිනම (2025.11.26) ලංසු විවෘත කිරීමේ කමිටුව විසින් ලංසු විවෘත කිරීම සිදු කරනු ලබන අතර, එම අවස්ථාවට ඔබට හෝ ඔබගේ නියෝජිතයෙකුට සහභාගී විය හැකිය.

06.ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ බලය රේගු අධ්‍යක්ෂ ජනරාල් සතුවේ.

මෙයට - විශ්වාසී,

ආර්.පී. මොහාන් විජේරත්න
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ (සේවා සැපයීම්)
රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට